සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**දෙවන වාර පරීක්ෂණය - 2025**
**Second Term Test - 2025**

**6 ශ්‍රේණිය** | **නාට්‍ය හා රංග කලාව** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකය:

## I - කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. කතන්දරයකට වඩා නාට්‍යයක් තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණයකි.
   (1) සංවාද තිබීම.　(2) කතාවක් තිබීම.
   (3) චරිත තිබීම.　(4) රංග විධාන තිබීම.

02. යමක් අසා රසවිඳින්නා,
   (1) ශ්‍රාවකයා　(2) පාඨකයා
   (3) කියවන්නා　(4) ප්‍රේක්ෂකයා

03. ''ගමරාළ සිල් ගත්තා වගෙයි.''
   (1) කතන්දරයකි.　(2) ජනකතාවකි.
   (3) කෙටි කතාවකි.　(4) නාට්‍යයකි.

04. ''දොංත බබක්කට දෙන්න දෙයක් නැත.
   පෙට්ටගමක් උඩ තුට්ටු දෙකක් ඇත.''　මෙය,
   (1) ගීතයකි.　(2) රබන් පදයකි.
   (3) කවියකි.　(4) සංවාදයකි.

05. වේදිකා නාට්‍යයක ලක්ෂණයක් නොවන්නේ,
   (1) නාට්‍ය පිටපතක් තිබීම.　(2) නළු නිළියන් සිටීම.
   (3) ප්‍රේක්ෂක පිරිසක් සිටීම.　(4) ඕනෑම වේලාවක බැලීමට හැකි වීම.

06. කට හඬ පාලනය පුහුණු කිරීම සඳහා උදව්කරගත හැකි අභ්‍යාස වන්නේ,
   (1) සංවේදන අභ්‍යාස　(2) සැහැල්ලු අභ්‍යාස
   (3) ශ්වසන අභ්‍යාස　(4) ශිථිලකරන අභ්‍යාස

07. පුංචි අපට දැන් තේරෙයි නාට්‍යයේ නිර්මාණකරු වන්නේ,
   (1) සෝමලතා සුබසිංහ　(2) පාලිත ලොකු පෝතාගම
   (3) D කුමාරගේ　(4) අම්තා රබ්බිඩ්ගල

08. පහත සඳහන් විවිධ චරිත ඇසුරින් අධිමානුෂ චරිත යුගලය වන්නේ,

(1) රජතුමා, යෝධයා (2) රියදුරා, ගොවියා

(3) භූතයා, කොටියා (4) දෙවියන්, සුරංගනාවිය

09. ''ඉර උදා වෙන්නට
පළමුව නැගිට සිහිකොට'' මෙය,

(1) ජන කවියකි. (2) සිරිත් මල්දමේ කවියකි.

(3) උපමාවකි. (4) ගාථාවකි.

10. සැමන් ටින් එකක අඩිය හිල්කොට තෙත ගෝණි ලණුවක් දමා ඇදීමේදී නිර්මාණය කළ හැකි හඬකි,

(1) ගෙරවිලි හඬ (2) කුරුල්ලන්ගේ හඬ

(3) ගෙම්බන් කෑගසන හඬ (4) වැහිපොද වැටෙන හඬ

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා දී ඇති ප්‍රකාශයන් හරිනම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද, ඉදිරියේ දී ඇති වරහන තුළ යොදන්න.**

11. අතීතයේ සිට කටින් කට පැවත එන කතා කෙටි කතා නම් වේ. ( )

12. ස්වභාවික පරිසරයේ සිදුවන විවිධ සිදුවීම් අපට අනුකරණය කර පෙන්විය හැකිය. ( )

13. චරිතයක් තුළ භූමිකා කිහිපයක් තිබිය හැකිය. ( )

14. යමක් නිර්මාණශීලීව ගොඩ නැංවීමේදී අපට පරිකල්පනය අවශ්‍ය නොවේ. ( )

15. චරිත නිරූපණයේදී විවිධ භාණ්ඩ නාට්‍යෝපකරණ ලෙස යොදාගත හැක. ( )

- **හිස්තැනට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා ලියන්න.**

**( භූමිකා / ක්ෂණික නිරූපණ / අනුකරණය / ඇඳුම් පැලඳුම් / තේමාව )**

16. චරිතයක විවිධ පැතිකඩ ........................................................................................................... නම් වේ.

17. පෙර සූදානමකින් තොරව යමක් කර පෙන්වීම ............................................................................ නම් වේ.

18. අනුෂංගික කලාවට අයත් වන්නකි, .......................................................................................

19. යමක් ඒ අයුරින්ම කර පෙන්වීම ............................................................................................ නම් වේ.

20. නාට්‍යයකින් සමාජයට දෙන පණිවිඩය නාට්‍යයේ ........................................................................ නම් වේ.

## II - කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්‍යය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 03 ට පිළිතුරු සපයන්න.**

01 (කුකුල් හාමි එළියට එයි. මී හාමිල හතර දෙනා දිව එයි. ගායක පිරිස මල් ගස්මෙන් සිට ගනිති.)

කුකුල් හාමිගේ

ගෙදර කොතන දෝ

කුකුල් හාමිගේ ගෙදර මෙතැනවේ

වේලාව කියනා මූණ කොතනදෝ

(i) ඉහත සංවාද ඛණ්ඩය අයත් නාට්‍ය කුමක්ද? (ලකුණු 02)

(ii) එම නාට්‍ය කාගේ නිර්මාණයක්ද? (ලකුණු 02)

(iii) කුකුල්හාමිගේ ගෙදර හොයන්නේ කවුරුන්ද ? (ලකුණු 02)

(iv) මෙහි වෙලාව කියනා මූණ කොතනදෝ යන්නෙන් හඳුන්වන්නේ කුමක්ද? (ලකුණු 02)

(v) මෙහි වත්තේ මල් ගස් ලෙස පෙනී සිටින්නේ කවුරුන්ද? (ලකුණු 02)

02 (i) ඔබ දන්නා ජන කතා දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(ii) ජනකතා ඇසුරින් ලියවුණු නාට්‍ය 02 ක් ලියන්න. (ලකුණු 03)

(iii) මෙම ජනකතා වලින් අපට ලැබෙන ප්‍රයෝජන ලියා දක්වන්න. (ලකුණු 04)

03 (i) ඔබ දන්නා රංග අභ්‍යාස දෙකක් ලියන්න. (ලකුණු 03)

(ii) රංග අභ්‍යාසවල යෙදීමෙන් නළුවෙකුට ලැබෙන ප්‍රයෝජන මොනවාද? (ලකුණු 03)

(iii) පංති කාමරයේදී හඬ අභ්‍යාසයක් සිදු කරන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 04)

04 (i) නාට්‍ය යනු කුමක්ද? (ලකුණු 03)

(ii) ඔබ දන්නා ළමා නාට්‍ය දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(iii) නාට්‍ය පෙළක දැකිය හැකි විශේෂ ලක්ෂණ 4 ක් ලියා දක්වන්න. (ලකුණු 04)

05 පහත දැක්වෙන සිදුවීම මුල් කොට ඔබට කැමති අයුරින් සංවාදයක් ගොඩ නගන්න.

කැලෑවක හාවෙක් උදුපියලිය කන හැටි බලා සිටින නරියෙක්. (ලකුණු 10)

| 6 ශ්‍රේණිය | දෙවන වාර පරීක්ෂණය 2025 | නාට්‍ය හා රංග කලාව |
|---|---|---|

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 4 | 02 | 1 | 03 | 2 | 04 | 2 | 05 | 4 | 06 | 3 | 07 | 1 | 08 | 4 |
| 09 | 2 | 10 | 3 | 11 | ✗ | 12 | ✓ | 13 | ✓ | 14 | ✗ | 15 | ✓ | 16 | භූමිකා |
| 17 | ක්ෂණික නිරූපණ | | | | | 18 | ඇඳුම් පැලඳුම් | | | 19 | අනුකරණය | | | 20 | තේමාව |

## II කොටස

01 (i) පුංචි අපට දැන් තේරෙයි. (ල. 02)

(ii) සෝමලතා සුබසිංහ මහත්මිය (ල. 02)

(iii) මී පැටව් (ල. 02)

(iv) ඔරලෝසුව (ල. 02)

(v) ගායක පිරිස (ල. 02)

02 (i) නාඩි බැලීම / බිහිරි හටන / අන්දරේ සීනි කාපු හැටි / පුහුල් හොරා කරෙන් දැනේ.... ආදී වශයෙන් සිසුවා ලියා ඇති ආකාරය බලා ලකුණු දෙන්න. (ල.03)

(ii) තොප්පි වෙළෙන්දා / නරිබෑනා / රත්තරන් / එලොව ගිහින් මෙලොව ආවා. (ල.03)

(iii) උසස් පරිකල්පන (සිතීමේ හැකියාව) ශක්තිය දියුණු කරගැනීමට හැකිවීම.
රසවත් අවස්ථා රසවිඳීමට ඇති හැකියාව.
නිර්මාණාත්මක ශක්තිය දියුණු කර ගැනීමට හැකිවීම.
සමාජයට හොඳ පණිවිඩයක් දීමට හැකි වීම.
නාට්‍ය වැනි විවිධ නිර්මාණ බිහිකිරීමට හැකියාව ලැබීම.
විනෝදය ලබා ගැනීමට හැකිවීම. (ල.04)

03 (i) හඬ අභ්‍යාස / ශිථිලකරණ අභ්‍යාස / සංවේදන අභ්‍යාස / තාපන අභ්‍යාස / ශ්වසන අභ්‍යාස (ල.03)

(ii) හඬ පාලනයට
සංවාද නිවැරදි උච්චාරණය කිරීමට හැකියාව ලැබීම.
කය හා මනස සැහැල්ලු කර ගැනීමට
සබකෝලය දුරු කර ගැනීමට ආදී වශයෙන් කරුණු 3 ක්වත් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.03)

(iii) සිසුවා ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල.04)

04 (i) කිසියම් අවස්ථාවක් සිද්ධියක් සංවාදන ඇතුලත්ව නරඹා රස විඳීමට ඇති කලාවකි. (ල.03)

(ii) මාෂා සහ වලහා / අමර ගියා දිව්‍යලෝකේ / පුංචි අපට දැන් තේරෙයි. / සෙල්ලං ලෙල්ලන් / තොප්පි වෙළෙන්දා / පොල්ගෙඩියට ජරමරේ. (ල.03)

(iii) කතාවස්තුවක් තිබීම / චරිත තිබීම. / රංග විධාන / ගැටුම් අවස්ථා / විරාම ලක්ෂණ ආදී වශයෙන් ලියා ඇති පිළිතුර සලකා බලා ලකුණු ලබා දෙන්න. (ල.04)

05 සිසුන් නිර්මාණශිලීව සංවාද ගොඩනගා ඇති ආකාරය බලා ලකුණු ලබා දෙන්න. (ල.10)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

6 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව

## ප්‍රායෝගික පරීක්ෂණය

01 ඔබ කැමති නාට්‍ය ගීතයක් ගායනා කරමින් රංගනයේ යෙදෙන්න. (ල. 15)

02 ඔබ කැමති ජනකතාවක් නාට්‍යානුසාරීව රසවත්ව ඉදිරිපත් කරන්න. (ල. 15)

03 පහත සඳහන් චරිත අතරින් ඔබ කැමති චරිකයක් තෝරාගෙන රංගනයේ යෙදෙන්න.

(1) දේවාලයක ශාස්ත්‍ර කියන ශාස්ත්‍ර කරුවෙක් හෝ කාරිනියක්

(2) පංතිභාර ගුරුතුමා හා ගුරුතුමිය

(3) බඩු විකුණන කපටි වෙළෙන්දෙක්

(4) මහමග හිඟමනේ යන හිගන්නෙක්.

(ගුරුවරයාට අභිමත පරිදි චරිත වෙනස් කර ගන්න.) (ල. 10)

04 පහත දැක්වෙන සංවාද ඛණ්ඩ අර්ථ තුනක් ඉස්මතු වෙන පරිදි ඉදිරිපත් කරන්න.

මට යන්න දෙන්න.

කවුද එහෙම කීවේ (ල. 10)

**ලකුණු පිරිනැමීම**

| | | |
|---|---|---|
| I කොටස | - | 20 |
| II කොටස | - | 30 |
| ප්‍රායෝගක පරීක්ෂණය | - | 50 |
| **මුළු ලකුණු** | - | 100 |